# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 4 දරන වීර පොදුජන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 පෙබරවාරි මස 16 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 පෙබරවාරි මස 20 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. **7.00 යි.** **තැපැල් ගාස්තුව :** රු. **5.00 යි.**

# 2009 අංක 4 දරන වීර පොදුජන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 පෙබරවාරි මස 16 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී) 12/2006.

**වීර පොදුජන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"වීර පොදුජන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් විසින් එකඟ වූ රීති අනුව එකී පදනමට අදාළ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටුකරගෙන යාමේ කාර්යය සඳහා 1993 සිට පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම්කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2009 අංක 4 දරන වීර පොදුජන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

වීර පොදුජන පදනම සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මක වන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) වීර පොදුජන පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කෙරෙන සංස්ථාවට මින් මතු බඳවාගනු ලබන සාමාජිකයන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "වීර පොදුජන පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද, සියලුම අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබාගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ද, ඊට ඇත්තේ ය.

පදනමේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, එම පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ :—

(අ) ජීවිතය ආරක්ෂා කිරීමට ගරු කිරීම, පෝෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම ;

(ආ) තමාගේ ජීවිතය පරදුවට තබා අනෙක් අයගේ ජීවිත බේරා ගැනීම සඳහා පොදු ජනයා විසින් ස්වේච්ඡාවෙන්ම කරන ලද ක්‍රියා ජාතික වශයෙන් සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගෙන ඒ සඳහා ත්‍යාග ප්‍රදානය කිරීම ;

(ඇ) ජීවිතය ආරක්ෂා කිරීම සඳහා වූ ආරක්ෂක පියවර ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) ජීවිතයට ඇති අනතුරුවල හෝ අභාග්‍යයන්ගේ විවිධ පැතිකඩ සම්බන්ධයෙන් සහ ඒවා මග හැරීම පිළිබඳ දැනුවත් කිරීම, දැනුම ලබාදීම සහ පුහුණුව වැඩි දියුණු කිරීම ;

(ඉ) ජීවිතයට ඇති විවිධ අනතුරු පිළිබඳව සහ ආරක්ෂණ ක්‍රම සහ තාක්ෂණයන් පිළිබඳ දැනුවත් කිරීම ;

(ඊ) ජීවිත ආරක්ෂාව සහ පොදුජන වීරත්වය යන ක්ෂේත්‍රවල කටයුතු ප්‍රවර්ධනය කිරීම ;

(උ) මනුෂ්‍යයන්ට සහ සතුන්ට හිංසා කිරීමට එරෙහිව පියවර ගැනීම අදාළ කර ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ඌ) ලෝක පොදු ජන වීරත්වය සහ ජීවිත ආරක්ෂාව යන සංකල්ප ඉස්මතු කර ක්‍රියාත්මක කිරීමට ජාත්‍යන්තර සංවිධානයක් පිහිටුවීම සඳහා ආරම්භකයකු ලෙස කටයුතු කිරීම ;

(එ) පොදුජන වීරත්වය පිළිබඳ අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා එකම හෝ සමාන අරමුණු ඇති ජාත්‍යන්තර සංවිධාන සමග සම්බන්ධතා පිහිටුවා ගැනීම සහ අභාග්‍යසම්පන්න සිද්ධීන් වැළැක්වීම සහ මනුෂ්‍ය සංහතියට සිදුවන අභාග්‍යසම්පන්න සිද්ධි පිළිබඳව සහ ඒවා වැළැක්වීම පිළිබඳව ජාත්‍යන්තර පුහුණුවීම්, අධ්‍යාපන වැඩමුළු පිළියෙල කිරීම ;

(ඒ) ජීවිතය ආරක්ෂා කිරීම පිළිබඳ පොදුජන වීරත්වය ගරු කිරීම ; සහ

(ඔ) පොදුජන වීරත්වය පිළිබඳ සංකල්ප සහ ජීවිතාරක්ෂක ක්‍රම පිළිබඳව තවදුරටත් උපකාරී වන සංස්කෘතික කටයුතු හා මාධ්‍ය ප්‍රචාරක කටයුතු වල නියැලීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් හෝ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත තැනැත්තන්ගෙන් ප්‍රදාන හෝ පරිත්‍යාග ලබාගැනීම හෝ එකතු කර ගැනීම, අරමුදල් ආයෝජන කිරීම් සහ සංස්ථාවේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්ය සඳහා නිලධරයන් සහ සේවකයන් යෙදවීම, සේවයේ නියුක්ත කරවීම සහ සේවයෙන් පහ කිරීම ඇතුලු කවර හෝ සියලු ක්‍රියා, කාරණා සහ දේවල් කිරීමට ද, ඉටුකිරීමට ද සංස්ථාවට බලය තිබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු, සභාපතිවරයා, ගරු ලේකම්වරයා, ගරු භාණ්ඩාගාරිකවරයා සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව සභාපතිවරයා විසින් නම් කරනු ලබන වෙනත් සාමාජිකයන් දෙදෙනකුට අඩු නොවන සංඛ්‍යාවකින් සංයුක්ත වන විධායක සභාවක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරන පදනමේ විධායක සභාවේ සාමාජිකයන්ගෙන් සංස්ථාවේ පළමුවන විධායක සභාව, සමන්විත විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුවද, පදනමේ ආරම්භක සභාපති, සංස්ථාවේ සභාපති විය යුතු ය.

(4) ආරම්භක සභාපතිට පසුව සභාපති ධුරයට හිස් වූ අවස්ථාවක, ඔහුගේ පවුලේ ඊළඟ හෝ ආසන්නතම ඥාතියා සංස්ථාවේ සභාපති විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන්ගේ යම් මහ සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ සහ

වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත සඳහන් කාරණා සියල්ලම සම්බන්ධයෙන් හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, එවැනි සාමාජික කොටස් විසින් ගෙවිය යුතු ගාස්තු සහ ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉවත්වීම හෝ නෙරපීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම ;

(ආ) විධායක සභාවේ සාමාජිකයන් සහ නිලධරයන් පත් කිරීම සහ විධායක සභාවේ සාමාජිකයන් ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හෝ ධුරය හිස් කිරීම, විධායක සභාවේ සාමාජිකයන්ගේ බලතල, කාර්ය සහ පැවැත්ම, සංස්ථාවේ විවිධ නිලධරයන් අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය කර්තව්‍ය සහ පැවැත්ම ;

(ඇ) විධායක සභාවේ සහ සංස්ථාවේ රැස්වීම් කැඳවීම, පැවැත්වීම සහ ඒ රැස්වීම්වල දී පුරප්පාඩු පිරවීමේ දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍ර හා රැස්වීම්වල ගණපූරණය හා රැස්වීම්වලදී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඈ) විධායක සභාවේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා වූ සුදුසුකම් සහ නුසුදුසුකම් ;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය සහ කළමනාකරණය ;

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් මෙම වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන්ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරුම්, පරිත්‍යාග, සම්මාදම් මුදල් හෝ ගාස්තු වශයෙන් ලැබෙන සියලු මුදල් විධායක සභාව විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) මේ පනත යටතේ සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, සිදු කිරීම සහ ඉටු කිරීම සඳහා දරන ලද වියදම් කිසිවක් ගෙවීමට අවශ්‍ය කරන සියලු මුදල් අරමුදලින් ගෙවිය යුතු ය.

(3) සංස්ථාවේ මුදල් මෙහි සඳහන් කර ඇති අරමුණු වැඩිදියුණු කිරීම සඳහා පමණක් අදාළ කරගනු ලැබිය යුතු අතර, ඉන් කිසිදු කොටසක් සංස්ථාවේ සාමාජිකයන් වෙත ගෙවීම හෝ ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ අන්‍යාකාරයේ කුමන ආකාරයකින් හෝ සෘජුව හෝ වක්‍රව පැවරීම නොකල යුතු ය.

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම්, බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබාගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම

ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

**9.** සංස්ථාවේ මුද්‍රාව ලේකම්වරයා භාරයේ තිබිය යුතු අතර තත්කාලයේ බලපවත්නා රීති මගින් නම් කරන ලද සංස්ථාවේ නිලධරයන් දෙදෙනෙකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. එසේ කරනු ලබන අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු කල අත්සනකට පරිභාහිරව විය යුතු ය.

සාමාජික නාම ලේඛනය.

**10.** (1) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව වූ දිනයේ දී කමිටුවේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකුගේ ම සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරගනු ලබන සෑම තැනැත්තකුගේ ම නම ඇතුළත් කළ යුතු සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාමට මණ්ඩලය විසින් කටයුතු කළ යුතු ය.

(2) ලේඛනයේ පහත සඳහන් විස්තර ඇතුළත් විය යුතු ය :—

(අ) සංස්ථාවේ එක් එක් සාමාජිකයාගේ නම, ලිපිනය සහ රැකියාව ;

(ආ) යම් සාමාජිකයකුගේ නම ලේඛනයේ සටහන් කරනු ලැබූ දිනය ;

(ඇ) යම් තැනැත්තකු සාමාජිකයකු වී සිටීම අවසන් වූ දිනය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.

**11.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සංගමය විසින් ගෙවිය යුතුව තිබුණු සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවීම සහ අයකර ගැනීම කළ යුතු අතර එදිනට සංගමයට අයවිය යුතුව තිබුණු සියලු ණය සහ ලැබිය යුතුව තිබුණු සියලු සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**12.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ බල පවත්නා 6 වන වගන්තිය යටතේ සාදනු ලැබූ රීතිවලට යටත්ව සංස්ථාව විසින් දැරිය යුතු ය. — සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**13.** සංස්ථාවේ ණය සහ බැරකම් අයකර ගැනීමේ කාර්ය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා සංස්ථාවට තමාගෙන් අයවිය යුතු සාමාජික ගාස්තු ප්‍රමාණයන් ඉක්මවා යන දායක මුදල් කිසිවක් ගෙවීමට සංස්ථාවේ කිසිදු සාමාජිකයකු යටත් නොවිය යුතු ය. — සාමාජිකයන්ගේ බැරකම් සීමා කිරීම.

**14.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් දේපළක් හෝ ආදායමක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. — විසුරුවා හැරීමේදී ඉතිරිවන දේපළ.

**15.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. — ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**16.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.